# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2110/43 - 2019 පෙබරවාරි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: RPDS/LND/09/ACQ/21 (VE).

*ඉඩම් අමාත්‍යාංශ අංකය*: 4-3/8/2016/VE/256.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 164A බඹරබොටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පැළෑඳගම ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත අ.ග.පි. අංක 423 දරන පිඹුරේ කැබලි අංක 113 සහ 114 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.8565 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 02 වේ.

01. කැබලි අංක 113

ඉඩමේ නම: පොතුඇටතැන්නේ මූකලාන; ඉඩම් පරිහරණය: වත්ත; හිමිකම් කියන්නා: හපුගස්තැන්න වැවිලි සමාගම, අංක 95/ඒ, නම්බපාන, ඉංගිරිය; ප්‍රමාණය: හෙක්ටයාර් 4.3285.

02. කැබලි අංක 114

ඉඩමේ නම: පොතුඇටතැන්නේ මූකලාන; ඉඩම් පරිහරණය: වත්ත; හිමිකම් කියන්නා: හපුගස්තැන්න වැවිලි සමාගම, අංක 95/ඒ, නම්බපාන, ඉංගිරිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5280.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.03.28 වැනි දින පෙ.ව. 10.00 ට රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2019.03.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

අයි. ආර්. එම්. ප්‍රදීපිකා ඩී. ඉළුක්කුඹුර,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2019 ජනවාරි මස 30 වැනි දින,
රත්නපුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

03-141



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ සංශෝධිත දැන්වීමයි

*මගේ යොමු අංකය*: 3/6/2016/8.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-201/7/36/එච්ඩබ්/111.

මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2008/39 හා 2017 මාර්තු මස 03 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද 7වෙනි වගන්තිය යටතේ දැන්වීමෙහි අනු අංක 125 යටතේ සඳහන් කර ඇති අංක 498 දරන බිම් කොටස සඳහන් ඡේදය මෙයින් අවලංගු කරනු ලැබේ.

ඒ වෙනුවට අවසාන ගම් පිඹුරු අංක 1493 කැබලි අංක 590, 591, 592 හා 593 දරන ඉඩම් කැබලි 04 මෙයින් ආදේශ කරනු ලබන බව මහජනතාවගේ දැනගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07වෙනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. **කැබලි අංකය 590**

ඉඩමේ නම: ගල් මොරටුගහමුල හේන කෝන්ගහමුල හේන; ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත වත්ත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඊ. එම්. සෝමාවතී. ඒ. එම්. සී. එන්. කුමාර, ඒ. එම්. එම්. කුමාර සහ ඒ. එම්. දිල්රුක්ෂි කුමාරි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0166.

02. **කැබලි අංකය 591**

ඉඩමේ නම: ගල් මොරටුගහමුල හේන කෝන්ගහමුල හේන; ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත වත්ත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඒ. එම්. සී. එන්. කුමාර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0166.

03. **කැබලි අංකය 592**

ඉඩමේ නම: ගල් මොරටුගහමුල හේන කෝන්ගහමුල හේන; ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත වත්ත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඒ. එම්. එම්. කුමාර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0400.

04. **කැබලි අංකය 593**

ඉඩමේ නම: ගල් මොරටුගහමුල හේන කෝන්ගහමුල හේන; ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත වත්ත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඒ. එම්. සී. එන්. කුමාර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0400.

මෙම ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලු දෙනාම තමන්ගේ නම් *ගැසට් පත්‍රයේ* පලවී ඇතත්, නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතියේ ස්වභාවය, ඉඩම/පරවශතාවය සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණන් බැලූ ආකාරය, එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම, පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වභාවය, එම ඉඩම් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉදිරිපත් කළ හැකි කරුණු පිළිබඳ විස්තරයක් 2019.02.15 දින මගේ කාර්යාලයේ දී මා හමුවී ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව 2019.03.05 දින සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී තමන් විසින්ම නැතහොත් ලිඛිතව බලය පවරනු නියෝජිතයකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමග මා විසින් නියම කරනු ලබන ස්ථානයක දී පනතේ 09 වෙනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතු ය.

පරීක්ෂණය සඳහා නියෝජිතයකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලද ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
පොල්ගහවෙල.

පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 142

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.